සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 16 S |
|---|---|---|

නම ..............................................

**ඉස්ලාම් ධර්මය** **කාලය පැය දෙකයි**

උපදෙස් : ★ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. "රිසාලත් " යන්නෙහි සිංහල අර්ථය
    1. ඒකීය දේව වාදය 2. ආදේශ කිරීම 3. අවසන් දිනය විශ්වාස කිරීම 4. ප්‍රතික්ෂේප කිරීම.
02. ඊමානයෙහි දෙවන කරුණ වන්නේ,
    1. මලාඉකාවරුන් විශ්වාස කිරීම 2. අල්ලාහ් විශ්වාස කිරීම.
    3. මරණයෙන් පසු ජීවිතය විශ්වාස කිරීම. 4. පාරිශුද්ධ ආගම් විශ්වාස කිරීම.
03. මව්කිරි පමණක් බොන අවුරුදු දෙකක් වයසැති පිරිමි දරුවෙකුගේ මූත්‍රා
    1. දැඩි නජීස් 2. සැහැල්ලු නජීස් 3. සමාන්‍ය නජීස් 4. නජීස් නැත.
04. මිඋරාජ් සිදුවීම සිදු වූ මාසය
    1. රජබ් 2. දුල්හජ් 3. සපර් 4. සව්වාල්
05. "මලකුල් මව්ත්" යනු
    1. ජිබ්රීල් (අලෛ) 2. මීකායිල් (අලෛ) 3. ඉස්රාෆීල් (අලෛ) 4. ඉස්රායීල් (අලෛ)

- **නිවැරදි නම් (✓ ) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද යොදන්න.**

06. "දිකර් කල්බ්" සිතින් මෙනෙහි කරන දික්ර් වේ. (      )
07. "ලෙයිලතුල් කද්ර්" මුහර්රම් මාසයේ ඒවි. (      )
08. සලාතය පිළිබඳව මරණයෙන් පසු විනිශ්චය කරනු නොලැබේ. (      )
09. මහකිල්ල දුරලන්නට ස්නානය කළ යුතුයි. (      )
10. සුනබයන්ගේ හම පදමට වේලා භාවිතා කළ හැක. (      )

- **යා කරන්න**

| | |
|---|---|
| 11. රිල්වාන් (අලෛ) | සව්ම් |
| 12. මආද් | පාප ක්ෂමාව |
| 13. උපවාසය | වහ්දානියියත් |
| 14. තව්බා | මරණයෙන් මතු ජීවිතය |
| 15. අල්ලාහ් | ස්වර්ගයේ අධිපති |

- **හිස්තැන් පුරවන්න.**

16. උපවාසයේ යෙදෙන්නන් ඇතුල්වන ස්වර්ග දොරටුව ..................................................... වේ.
17. අපි ................................................ පමණක් ප්‍රාර්ථනා කළ යුතු වේ.
18. සුනබ ලේ ................................................. නජීස් වේ.
19. "ලෙයිලතුල් කද්ර්", මාස ................................... වඩා ශ්‍රේෂ්ඨ වේ.
20. දිවෙන් උච්චාරණය කරන දික්ර් අරාබියෙන් .................................................. ලෙස හැඳින්වේ.

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) i. ඊමානයෙහි කොටස් දෙක ලියන්න.
ii. පිරිසිදුකම පිළිබඳව හදීසයක්ලියන්න.
iii. ස්නානයෙහි වර්ග දෙක කුමක් ද?
iv. අප ඉටුකරන (අතිරික්ත) සුන්නත් උපවාස දෙකක් ලියන්න.
v. "දික්ර්" හි කොටස් දෙක මොනවාද?
vi. රමළාන් උපවාසය අනිවාර්ය නොවූ දෙදෙනෙක් ලියන්න.
vii. "කබ්ර් " හි දී ප්‍රශ්න කරනු ලබන මලා ඉකාවරයා කවුද?
viii. "ඊමාන් ඉක්තියාරි" යනු කුමක්ද? (ල. 2 x 8 = 16)

(02) i. උපවාසයෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න. (ල. 03)
ii. මලා ඉකාවරුන් 4 දෙනෙකුගේ නම් ලියා ඔවුන් සතු වගකීම් හතර ද ලියන්න. (ල. 04)
iii. "දූඩ් නජීස්" පිරිසිදු කරන ආකාරය ලියන්න. (ල. 04)

(03) i. නජීස් වර්ග තුන කුමක් ද? (ල. 03)
ii. සලාතය මගින් අපට ලැබෙන ආනිසංස 04 ක් ලියන්න. (ල. 04)
iii. ප්‍රාර්ථනාවේ දී අනුගමනය කළ යුතු කරුණු 04 ක් සඳහන් කරන්න. (ල. 04)

(04) i. හදීසයේ සඳහන්වන පරිදි උපවාසකයෙකු සතුටු විය හැකි අවස්ථාවන් මොනවාද? (ල. 03)
ii. සුන්නත් ස්නානයන් 04 ක් ලියන්න. (ල. 04)
iii. අනවශ්‍ය වියදම් පිළිබඳව සඳහන් වන අල්කුර්ආන් වැකියක් ලියන්න. (ල. 04)

05) i. තයම්මුම් බිඳවැටෙන කරුණු 03 ක් ලියන්න. (ල. 03)
ii. වුළු පිළිබඳව පැවසෙන කුර්ආන් වැකියක් / හදීසයක් ලියන්න. (ල. 04)
iii. ඊමානිය (විශ්වාස කළ යුතු) කරුණු 04 ක් ලියන්න. (ල. 04)

(06) i. රිසාලත්හි අන්තර්ගත වන කරුණු 04 මොනවාද? (ල. 03)
ii. නබිවරුන් හතරක් සඳහන් කර ඔවුන් හට ලබාදුන් පාරිශුද්ධ ග්‍රන්ථ ද ලියන්න. (ල. 04)
iii. " ලා ඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ්" යන්නෙහි සිංහල අර්ථය ලියන්න. (ල. 04)

(07) i. "ජායිස්ගුණාංගය" යනු මොනවාද? (ල. 03)
ii. තයම්මුම් කිරීම සඳහා වූ හේතු 02 ක් ලියන්න. (ල. 04)
iii. අනිවාර්ය ස්නානය ඉටුකළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

පළමු වාර පරීක්ෂණය - 2019

ඉස්ලාම් ධර්මය

පිළිතුරු පත්‍රය

07 ශ්‍රේණිය

I කොටස

01 - 3
02 - 1
03 - 4
04 -
05 -

06 - ✓
07 - ✗
08 - ✗
09 - ✓
10 - ✗

11 - ස්වර්ගයේ අධිපති
12 - මරණයෙන් මතු ජීවිතය විශ්වාසය
13 - සව්මි
14 - පාප ක්ෂමාව
15 - වහ්දානියියතුන්

16 - රයියාන්
17 - අල්ලාහ් වෙත
18 - දූඩි
19 - දහසක්
20 - දික්ර් ලිසානි

II කොටස

(01) i. ඊමාන් මුජ්මල්, ඊමාන් මුපස්සල්
ii. පිරිසිදුකම ඊමානයෙහි අඩකි
iii. (ෆර්ල්) අනිවාර්ය ස්නානය, සුන්නත් ස්නානය
iv. සඳුදා, බ්‍රහස්පතින්දා, ආෂුරා, තාසුආ
v. දික්ර් කල්බ්, දික්ර් ලිසානි
vi. රෝගීන් / මගීන් / සංචාරකයින් / ගැබිණි මව්වරුන්, පුංචි ළමුන්
vii. මුන්කර් (අලෛ) නකීර් (අලෛ)
viii. ඊමානයෙහි සියලු කරුණු අවබෝධ කරගෙන එක් එක් කරුණු විස්තරාත්මකව හදාරා විශ්වාසය තැබීම.

(02) i. ● ඉවසීම හෝ සිත් සන්සුන් බව
● පව්වලින් දුරස්වීම
● කුසල් කිරීමේ තැකීම වැඩිවීම.
● දුප්පතාගේ කුසගින්නේ වේදනාව හඳුනාගෙන පරිත්‍යාග හා වියදම් කිරීම.
ii. පාඩම් පොත - පිටු අංක 19
iii. නියමිත නජීසය අයින් කිරීම, හත් වතාවක් ජලයෙන් සේදීම, මුලින්ම නැත මැද වැලි දමා සේදීම එසේ සෝදන විට හොඳින් සෝදා ගැනීම.

(03) i. දූඩි නජීස්, සාමාන්‍ය නජීස්, සැහැල්ලු නජීස්
ii. සලාතය ඉටුකිරීමෙන් කුසල් ලැබේ. ස්වර්ගය ලැබේ. නිසි වේලාවට ක්‍රියා කිරීමේ පුරුද්ද, නායකත්වයට කීකරු වීම, දේව තෘප්තිය, ශාරීරික අභ්‍යාස
iii. අල්ලාහ්ගෙන් පමණක් අයදීම, විශ්වාසයෙන් අයදීම ඥාති සබඳතා බිඳෙන් නොමැතිව ක්‍රියා කරවීම.
පිළිතුරට හදිසි නොවීම
හලාල් සුරකීම

(04) i. උපවාසයෙන් මිදෙන වේලාව, අල්ලාහ් හමුවන වේලාව
ii. ජුම්ආ ස්නානය, අලුත් අවුරුදු ස්නානය, ඉහ්රාම් වෙනුවෙන් ස්නානය, දෛනික ජීවිතයේ පිරිසිදුකම සඳහා ස්නානය කිරීම, සූර්ය ග්‍රහණය සලාතය සඳහා ස්නානය
iii. "නියත වශයෙන් අනවශ්‍ය නාස්ති කරන්නා ෂෙයිතාන්ගේ සහෝදරයන්ය" (අල්කුර්ආන්)
"කන්න, බොන්න, නාස්ති නොකරන්න".

(05) I. වුළූඃ කඩවන සියලුම කාරණයන්
ජලය දැක්මෙන්
රෝගය සුව වීමෙන්
ii. පෙළ පාඩම් පොත පිට අංක 35
iii. අල්ලාහ්, මලා ඉකාවරුන්, ආගමික පාරිශුද්ධ ග්‍රන්ථ, නබිවරුන්, මරණයෙන් මතු ජීවිතය, දෛවය (කළාකද්ර්)

(06) i. නබිවරුන්, පාරිශුද්ධ ආගමික ග්‍රන්ථ, සුහුෆ්
ii.

| | |
|---|---|
| දාවුද් (අලෛයි) | සබූර් |
| මූසා (අලෛයි) | තෞරාත් |
| ඊසා (අලෛයි) | ඉන්ජීල් |
| මුහම්මද් (සල්) | ෆුර්කාන් / අල්කුර්ආන් |

iii. නැමදීමට අවනත සුදුසු දෙවියන් අල්ලාහ් හැර වෙන දෙවිකෙනෙකු නොමැත. මුහම්මද් (සල්) ඔහුගේ දූතයන් වේ.

(07) I. අල්ලාහ්ට තිබිය නොතිබිය හැකි ගුණාංග නැතහොත් දෙවියන් කැමති දෑ කැමැති ලෙස කිරීමේ ගුණාංගය ජායිස් ගුණාංගය ලෙස හැඳින්වේ.
ii. ජලය නොමැති විට
බීමට පමණක් ජලය තිබෙන විට
අසනීපය හේතුවෙන් ජලය භාවිතා කිරීමට නොහැකි වීමේ දී
iii. අනිවාර්ය ස්නානය ඉටුකිරීමට වඩාත් සුදුසු ජලය භාවිතා කළ යුතුය.
මුලින්ම මූත්‍රා පහකරගත යුතුය.
අව්රත් වැසෙන පරිදි ඇඳගත යුතුය.
අපිරිසිදු දෑ ගැවී තිබුණහොත් ඒවා අයින් කරගත යුතුය.
වුළූඃ ගත යුතුය.
ශරීරය පුරා ජලය යොදා සම්පූර්ණයෙන්ම නෑම.